- 2023 සැප්තැම්බර් 16 දින තායිලන්තයේ සිට වැඩම කරන ලද පිණ්ඩපාතයේ වැඩි භාවනා යෝගී ස්වාමීන්වහන්සේලා 300 නමකට පමණ පළතුරු පූජා කිරීම.
- 2023 ඔක්තෝම්බර් 01 දින බොරැල්ල ශ්‍රී ලංකාරාම විහාරයේදී හිඟුරේ ප්‍රඥාසේකර ස්වාමීන්වහන්සේ විසින් ධර්ම දේශනයක් පවත්වන ලදී
- 2023 දෙසැම්බර් 21 දින මහියංගන රජමහා විහාරයේ චාරිකාව සිදු කර 2600 සම්බුද්ධත්ව ජයන්ති සමරු බුද්ධ ප්‍රතිමා වහන්සේ අභියස විශේෂ පිං කමක් සිදු කරන ලදී.
- 2023 දෙසැම්බර් 03 දින මියගිය මෙත් සවිය සාමාජිකයින්ට පිං පිණිසත් සුජිවත්ව සිටින මෙත් සවිය සාමාජිකයින්ට ආශිර්වාද පිණිසත් දානමය පිංකමක් සිදුකරන ලදී.
- 2023 දෙසැම්බර් 26 දින ඇලිපිටිය විහාරමහාදේවි පිරිවෙනේ අධ්‍යාපනය ලබන ස්වාමින්වහන්සේලාට අවශ්‍ය ද්‍රව්‍ය පරිත්‍යග කරන ලදී.
- 2024 ජනවාරි 01 දින වසරේ පළමු හීල් දානමය පිංකම හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේදී සිදුකරන ලදී. බොරැල්ල ජයන්ති ළමානිවාසයේදී කුඩා ළමුන් සඳහා දිවා ආහාරය සහ ත්‍යාග ප්‍රධානය කරන ලදී.
- 2024 ජනවාරි 01 දින බොරැල්ල ශ්‍රී ලංකාරාමයේ දහම් පාසලට අවශ්‍යය ඩෙස් සහ පුටු පරිත්‍යාග කිරීම.
- 2024 පෙබරවාරි 25 දින අක්ෂි සායනයක් බොරැල්ල ශ්‍රී ලංකාරාම විහාරයේදී පවත්වන ලදී.
- 2024 මාර්තු 03 දින සාර්ථකව ඉගෙන ගන්නා අන්දම පිළිබඳව අධ්‍යාපන වැඩමුළුව සිදුකරන ලදී.
- 2024 අප්‍රේල් 20 දින ගැබිණි මව්වරු 25 දෙනෙකුට අවශ්‍ය ද්‍රව්‍ය බෙදා දෙන ලදී.
- 2024 අප්‍රේල් 21 දින 50 වන කණ්ඩායම ආරම්භ කරන ලදී. ඇස් කණ්ණාඩි බෙදා දීමක් සිදු කරන ලදී. ගැබිණි මව්වරු පිරිසකට අවශ්‍ය ද්‍රව්‍ය බෙදා දෙන ලදී.
















# සිහිනෙන් සිතුවත් සෙත සැලසෙන බුදුරජාණන් වහන්සේගේ ගුණස්කන්දය

අවිද්‍යා අන්ධකාරය දුරු කොට, උතුම් වූ චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කොට, මේ ලෝ සතුන්ට පරම සුවය, ඒකාන්ත නිවන් මඟ දේශනා කොට වදාළේ අපගේ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේයි. ඒ භාග්‍යවතුන් වහන්සේ වියළි කතරට ඇද හැළෙන මහාමේඝයක් සේ රාග, ද්වේෂ, මෝහ ආදි අකුසලයන්ගෙන් දැවීගත් සිත් ඇති මිනිසුන්ගේ සිත් නිවා සනසන දහම් වැස්සවූ එක ම ශාස්තෘන් වහන්සේ වෙති. භාග්‍යවතුන් වහන්සේ නොමඟ යන මිනිසුන්ට, බ්‍රහ්මයන්ට, දෙවියන්ට, හරිමඟ කියා දෙන එක ම ගුරු දෙවිඳු වන සේක. අඳුරු ලොව එළිය කරන සඳ මඬල බඳු ය. තුන්ලෝකය ම ආලෝකවත් කළ හිරු මඬල බඳු ය. ඒ සම්මා සම්බුදුරජාණන් වහන්සේ, මේ ලෝකයේ බබළන්නා වූ සියල්ල ම අභිබවා බබළන සේක.

**සිහිනෙන් සිතුවත් සෙත සැල සෙන්නේ**
**බිහිසුණු අනතුරු දුක් දුරු වන්නේ**
**සිහිකර ඒ නව ගුණ මුනිඳුන්නේ**
**දෙසිතින් තොරවී බැතින් වඳින්නේ**

මේ කවිය වනාහී ටිබෙට් ජාතික එස්. මහින්ද හිමියන් විසින් සේරුවිල මංගල මහා සෑය වර්ණනා කොට ලියූ කවි පන්තියේ එන්නක්. මේ කවිය ඉතාමත් හරවත්.

"පින්වත් දෙවිඳ, මේ ලෝකයේ බබළන දේවල් හතරක් තියෙනවා. මෙහි පස්වැන්නක් නෑ. දහවලට හිරු බබළනවා, රාත්‍රියට සඳු බබළනවා, දවල් රෑ දෙකේ ම ඒ ඒ තැන ගින්න බබළනවා. ඒ බබළන්නා වූ දේවල් අතරින් සම්මා සම්බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨයි. ඒ ආලෝකය උත්තරීතරයි.
(මාඝ සූත්‍රය සං. නි. 01)

මේ ශ්‍රේෂ්ඨ වූ, උත්තරීතර වූ බැබළීමක් ඇති තුන්ලෝකය ම ආලෝකවත් කරන භාග්‍යවතුන් වහන්සේගේ ගුණ කඳ යමෙක් සිහිනෙන් සිතුවත් එයින් සැලසෙන සෙත අනන්ත ය, අප්‍රමාණ ය. ඒ බව බුද්ධ දේශනා, ධර්ම ග්‍රන්ථ ආදිය කියවීමේ දී අපට හොඳින් තේරුම් ගන්නට හැකියි. භාග්‍යවතුන් වහන්සේ වැඩ සිටි කාලයේ මිනිසුන්, දෙවියන් භාග්‍යවතුන් වහන්සේගේ ගුණ සිහිකිරීම නිසා බොහෝ අනතුරුවලින් මිදුන බව අප අසා තිබෙනවා. අද පවා භය හිතෙන තැන්වලින් ගමන් ගන්නා විට දී හෝ සිතකට භයක් තැති ගැන්මක් උපදින විට දී අපි භාග්‍යවතුන් වහන්සේගේ ගුණ සිහිකරනවා. එවිට සිතේ ඇති භය, ලොමු ඩැහැගැනීම් මග හැරී සිත ප්‍රීතිමත්ව ශාන්තභාවයට පත්වෙනවා.

**අපි ගෙදර දොර, වැඩපළේ යම් කර්මාන්තයක් කරනා විට ඊට ප්‍රථම ව භාග්‍යවතුන් වහන්සේ ව, ශ්‍රී සද්ධර්මය, ආර්ය මහා සංඝරත්නය යන තෙරුවන් සිහි කළ යුතු ම යි. එවිට අපට තිසරණ-යේ අනන්ත ආශිර්වාදය ලබා ගන්න පුළුවන්.**

"පින්වත් මහණෙනි, මමත් ඔබට මෙහෙම කියනවා. පින්වත් මහණෙනි, ඔබත් අරණකට ගියාම හරි, පාළු තැනකට ගියාම හරි යම් හෙයකින් ඔබට භයක්, තැති ගැනීමක්, ලොමුඩැහැගැනීමක් හටගත්තොත් අන්න ඒ වෙලාවට ඔබ මා ගැන ම යි සිහිකරන්න ඕන. මෙසේ ඒ භාග්‍යවතුන් වහන්සේ අරහං වන සේක, සම්මා සම්බුද්ධ වන සේකාව භගවා වන සේක කියලා. එවිට පින්වත් මහණෙනි, ඔබගේ භය, තැතිගැනීම්, ලොමුඩැහැගැනීම් තියෙනවා නම් ඒවා නැතිවෙලා යනවා.

එයට හේතුව කුමක් ද? පින්වත් මහණෙනි, තථාගත වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ කියලා කියන්නේ, රාගය දුරු කළ කෙනෙක්, ද්වේෂයෙන් තොර කෙනෙක්, මෝහයෙන් තොර කෙනෙක්, භය නොවන කෙනෙක්, තැති නො ගන්න කෙනෙක්, කම්පා නො වන කෙනෙක්, පලා නො යන කෙනෙක්."
(ධජග්ග සූත්‍රය සං. නි. 01)
මේ ආකාරයට බුදුරජාණන් වහන්සේ සිහිකිරීමෙන් අපේ භය, තැති ගැනීම් මග හරවා ගන්නට හැකි වන්නේ උන්වහන්සේගේ නිකෙලෙස් භාවය නිසයි.

රජගහනුවර දර කපලා ජීවත්වෙන කෙනෙක් හිටියා. මෙයා අන්‍යාගමිකයෙක්. නිගණ්ඨයන්ගේ ශ්‍රාවකයෙක්. ඔහු බුදුරජාණන් වහන්සේගේ ගුණ සිහිකරනවාට කැමති නෑ. ඔහුට පුතෙක් හිටියා. ඔහුත් ඒ වගේ ම යි. බුදුරජාණන් වහන්සේව සිහිකරනවාට කැමති නෑ. මේ දරුවාට යාළුවෙක් හිටියා. ඔහු තෙරුවන් සරණ ගිය පවුලක දරුවෙක්. මේ දරුවා අර අන්‍යාගමික දරුවත් සමඟ නිතර ම සෙල්ලම් කරනවා. තෙරුවන් සරණ ගිය දරුවා ඕනෑම දෙයක් කරන්න පටන් ගන්න කොට ම "නමෝ බුද්ධාය" කියලා තමයි පටන් ගන්නේ. ඒ නිසා මෙයා කරන සියලු ම දේ සාර්ථක ව, යහපත් ව සිදුවෙනවා. අන්‍යාගමික දරුවා නිගණ්ඨයන් සිහි කරමින් "නමෝ අරහන්තානං" කියන්න පුරුදු වී සිටියත් ඔහු කරන්නා වූ දේවල් යහපත් ව සිදු වූයේ නෑ.

දවසක් අර තෙරුවන් සරණ ගිය දරුවාගෙන් අන්‍යාගමික දරුවා මෙහෙම අහනවා. "යාළුවා ඔයා හැම දෙයක් ම කරනකොට 'නමෝ බුද්ධාය' කියනවා. හැම තිස්සේ ම ඔයාගේ දේවල් සාර්ථක වෙනවා. සෙල්ලම් කරන කොට දිනනවා. මම කොයි තරම් 'නමෝ අරහන්තානං' කිව්වත් වැඩක් නෑ. මාගේ දේවල් අසාර්ථකයි. මම පරදිනවා මටත් බැරි ද ඔයාගේ ක්‍රමේ උගන්වන්න?" කියලා.

එතකොට අර තෙරුවන් සරණ ගිය දරුවා කියනවා, "යාළුවා මම නිකම් ම නිකම් නමෝ බුද්ධාය කියනවා නෙමේ. මේකේ ලොකු අර්ථයක් ඇතුව තමයි කියන්නේ කියලා. මම සරණ ගියේ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ව යි. ඒ බුදුරජාණන් වහන්සේගේ ගුණ දැනගෙන ම තමයි මම 'නමෝ බුද්ධාය' කියලා කියන්නේ." ඉතින් ඒ විදිහට කියනකොට අන්‍යාගමික ළමයාට මේ කාරණය හොඳට තේරුනා. ඔහුත් බුදුගුණ දැනගෙන 'නමෝ බුද්ධාය' කියන්න පුරුදු වුණා.

දැන් මේ දරුවත් භාග්‍යවතුන් වහන්සේ ව සිහිකරනවා. පුංචි හිත්වලට පවා අපගේ බුදුරජාණන් වහන්සේගේ ගුණයන් දැනෙන ආකාරය අපූරුයි. ඔහු ඒ බුදු ගුණ අහලා දමනය වුණා. නිඝණ්ඨයන් සිහි කිරීම අත්හැරියා. ඒ බුදු ගුණ හමුවේ ඔහු දමනය වුණේ භාග්‍යවතුන් වහන්සේ අනුත්තරෝ පුරිසදම්මසාරථී ගුණයෙන් යුතු නිසාවෙන්.

දිනක් අර අන්‍යාගමික ව සිට බුදුරජාණන් වහන්සේ ව සරණ ගිය දරුවා පියත් සමඟ දර කපන්න කැලයට ගියා. දර කපාගෙන කරත්තය පුරෝගෙන ආපසු එන්න පිටත් වුණා. මේ එන අතර ආහාර ගන්න කියලා සොහොනක් ළඟ නතර වුණා. කරත්තේ ගැට ගසා සිටි ගොන්නු දෙන්නත් ලිහලා දෙදෙනා ම දැන් ආහාර අනුභව කරනවා. මේ අතරේ වෙනත් ගොන් රැනක් සමඟ මොවුන්ගේ ගොන් දෙදෙනාත් නගරයට යන්න ගියා. පියා නගරයට ගොස් ගොන් දෙන්නා සොයාගන්න පරක්කු වුණා. රෑ වුණා. නගරේ දොරවල් වහලා. දැන් තාත්තා නගරේ ඇතුළේ. දරුවා නගරයෙන් පිට

සොහොන ළඟ. තාත්තා ආපු නැති නිසා දරුවා ගෝනියක් එළාගෙන කරත්තේ යට නිදා ගත්තා.

මේ සොහොනෙ හිටපු අමනුෂ්‍යයන් දෙදෙනෙක් මේ ළමයා ව දැක්කා. මේ දෙන්නා අතරින් එක්කෙනෙක් භාග්‍යවතුන් වහන්සේ කෙරෙහි පැහැදිලා හිටියා. අනෙක් අමනුෂ්‍යයා පැහැදිලා හිටියේ නෑ. එයා භාග්‍යවතුන් වහන්සේට විරුද්ධයි. ඔහු අනෙක් අමනුෂ්‍යයාට කියනවා, "යාළුවා මෙන්න කෑමක් අපි මූ ව කමු" කියලා. අනෙක් අමනුෂ්‍යයා මේකට විරුද්ධ වුණා. එපා කිව්වා. එහෙත් නපුරු වූ අමනුෂ්‍යයා, භාග්‍යවතුන් වහන්සේට පැහැදිලා හිටපු නැති කෙනා ඒ කීම ඇහුවේ නෑ. එපා කියද්දි අර ළමයාගේ අතින් ඇද්දා. අදිනකොට ම දරුවාට ඇහැරුණා. මහා හඬින් "නමෝ බුද්ධාය" කියලා කිව්වා. අමනුෂ්‍යයා දරුවාගේ අතින් අතහැරියා. වහා ම නගරයට ගියා. ඒ යන අතරේ අනිත් අමනුෂ්‍යයා ළමයාගේ රැකවරණයට හිටියා. බලන්න භාග්‍යවතුන් වහන්සේ ව සරණ ගිය කෙනාට තියෙන රැකවරණය.

නගරයට ගිය යක්ෂයා බිම්බිසාර රජ්ජුගේ ආහාර අනුභව කරන රන් තැටිය රැගෙන ඒකට ආහාර බෙදාගත්තා. සොහොන ළඟට ආවා. යක්ෂයන් දෙදෙනා දරුවගේ දෙමව්පියන්ගේ වෙස්ගෙන දරුවා අවදි කරවා ආහාර කවා දරුවා නින්දට ගිය අතරතුර යන්නට ගියා. රන් තැටියේ යක්ෂානුභාවයෙන් රජුට පමණක් පෙනේවා කියලා අකුරු වගයක් සලකුණු කරලා කරත්තයට දාල තමයි ගියේ. උදෑසන ම නගරයේ සිටි පියා දරුවා ළඟට පැමිණියා. දරුවත් රැගෙන හණික නගරයට පිටත් වුණා.

ඒ අතර නගරයේ මහා කලබලයක්. ඇයි රජ්ජුගේ ආහාර අනුභව කරන රන් තැටිය හොරු අරන්. නගරයේ දොරටු වහලා හැම තැන ම පරීක්ෂා කරනවා. රාජ පුරුෂයන් මේ දරුවන්ගේ කරත්තයත් පරීක්ෂා කළා. රන් තැටිය දුටු රාජපුරුෂයන් දරුවාත්, පියාත් රජු ළඟට අරන් ගියා. රන් තැටියේ සලකුණු වී ඇති අකුරු දුටු රජු මොවුන්ගෙන් ප්‍රශ්න කළා. රාත්‍රියේ සිදුවූ දේ දරුවා රජු ඉදිරියේ ප්‍රකාශ කළා. රජු හරි ම බුද්ධිමත්. මොවුන් රැගෙන භාග්‍යවතුන් වහන්සේ සමීපයට ගියා. මේ පුවත සැල කළා. අප මහා කාරුණිකයන් වහන්සේ මේ පුවත අරබයා ඉතාමත් ලස්සන ගාථා හයක් දේශනා කොට වදාළා.

**"සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගෝතමසාවකා**
**යේසං දිවා ච රත්තෝ ච් නිච්චං බුද්ධගතාසති."**
"යමෙක් දිවා රෑ දෙකෙහි ම නිතර ම බුදු ගුණ සිහි කරනවා නම් ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ නිතර ම ප්‍රබෝධයෙන් ම යි පිබිදෙන්නේ."

**"සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගෝතමසාවකා**
**යේසං දිවා ච රත්තෝ ච් නිච්චං ධම්මගතාසති."**
"යමෙක් දිවා රෑ දෙකේ ම ධර්මය සිහි කරනවා නම් ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක වූ ඔවුන් හැමදාම ඉතා ම ප්‍රබෝධයෙන් පිබිදෙන්නේ."

**"සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගෝතමසාවකා**
**යේසං දිවා ච රත්තෝ ච් නිච්චං සංඝගතාසති."**
"යමෙක් දවල්ටත් රාත්‍රියටත් නිතර ම සඟ ගුණ සිහිකරනවා නම් ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවක වූ ඔවුන් ප්‍රබෝධයෙන් තමයි පිබිදෙන්නේ."

**"සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගෝතමසාවකා**
**යේසං දිවා ච රත්තෝ ච් නිච්චං කායගතාසති"**
"යමෙක් දහවල් රාත්‍රී දෙකෙහි ම නිතර ම කායානුපස්සනා භාවනාවේ යෙදී වාසය කරනවා නම්, ගෞතම බුදුරජාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ වූ ඔවුන් ප්‍රබෝධවත්වයි පිබිදෙන්නේ."

**"සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගෝතමසාවකා**
**යේසං දිවා ච රත්තෝ ච අහිංසාය රතෝ මනෝ"**
"යමෙක් දහවලටත් රාත්‍රියටත් නිතර ම අහිංසාවට ඇළුණු සිතින් වාසය කරනවා නම් ගෞතම බුදු සමිඳුන්ගේ ශ්‍රාවකයෝ වුණ ඔවුන් හැමදාමත් ප්‍රබෝධවත්වයි පිබිදෙන්නේ."

**"සුප්පබුද්ධං පබුජ්ඣන්ති සදා ගෝතමසාවකා**
**යේසං දිවා ච රත්තෝ ච් භාවනාය රතෝ මනෝ"**
"යමෙක් දහවලටත් රාත්‍රියට නිතර ම සමථ විදර්ශනා භාවනාවේ ඇලී වාසය කරනවා නම් ගෞතම බුදු සමිඳුන්ගේ ශ්‍රාවකයෝ වූ ඔවුන් හැමදාමත් ප්‍රබෝධවත්වයි පිබිදෙන්නේ."

ඉහත කතාවේ පුංචි දරුවා යක්ෂයන්ගෙන් බේරුණේ අපගේ ශාස්තෲන් වහන්සේ ව සිහිකිරීම නිසායි. ඒ භාග්‍යවතුන් වහන්සේ ව සිහිකරලා කරදරයකින් බේරුණ තවත් කෙනෙකුගේ කථාවකුයි මේ කියන්න යන්නේ. ඒ සත්ථා දේවමනුස්සානං ගුණයෙන් බැබළුණ භාග්‍යවතුන් වහන්සේගේ පිහිට ලැබූ දෙව් කෙනෙක් ගැනයි.

භාග්‍යවතුන් වහන්සේගේ කාලයේ සුරයන් හා අසුරයන් අතර යුද්ධයක් ඇති වුණා. මේ සටනේ දී චන්දිම කියන දිව්‍ය පුත්‍රයා රාහු කියන අසුරයාගේ ග්‍රහණයට අසුවුණා. දැන් රාහු අසුරයා චන්දිම දිව්‍ය පුත්‍රයා ව අල්ලාගෙනයි ඉන්නේ. චන්දිම කියන දිව්‍ය පුත්‍රයා භාග්‍යවතුන් වහන්සේ සරණ ගියපු කෙනෙක්. ඒ නිසා මේ වෙලාවේ චන්දිම දිව්‍ය පුත්‍රයා භාග්‍යවතුන් වහන්සේ ව සිහිකරන්නට වුණා.

**"නමෝ තේ බුද්ධවීරත්ථු විප්පමුත්තෝසි සබ්බධි**
**සම්බාධපටිපන්නෝස්මි තස්ස මේ සරණං භවාති"**
"බුද්ධ වීරයන් වහන්ස, ඔබ වහන්සේට නමස්කාර වේවා. ඔබ වහන්සේ සැම දෙයින් ම නිදහස් වෙලා වැඩ සිටින සේක. මා දැන් කරදරයක පැටලිලයි ඉන්නේ. මා හට පිහිට වන සේක්වා!" චන්දිම දිව්‍ය පුත්‍රයා මෙසේ භාග්‍යවතුන් වහන්සේ ව සිහිකරන බව භාග්‍යවතුන් වහන්සේට පෙනුනා. ඒ අපගේ කාරුණිකයන් වහන්සේ තමන් වහන්සේගේ ඍද්ධි බලයෙන් රාහු අසුරයාට ඇසෙන්නට චන්දිම දිව්‍ය පුත්‍රයා වෙනුවෙන් ගාථාවක් දේශනා කොට වදාළා.

**"තථාගතං අරහන්තං චන්දිමා සරණං ගතෝ**
**රාහු චන්දං පමුඤ්චස්සු බුද්ධාලෝකානුකම්පකාති"**
"ඒයි රාහු, චන්දිම දිව්‍යපුත්‍රයා අරහත් වූ තථාගතයන් වහන්සේ ව සරණ ගිහිල්ලයි ඉන්නේ. තථාගතයන් වහන්සේලා මහා අනුකම්පා සහිතයි. ඔය චන්දිම දිව්‍ය පුත්‍රයා නිදහස් කරන්න."
(චන්දිම සූත්‍රය සං. නි. 01)

රාහු අසුරේන්ද්‍රයා බියට පත් වුණා. තැතිගැනීමට පත් වුණා. වහා ම චන්දිම දිව්‍ය පුත්‍රයා ව අත්හැරියා.

දැන් අපට මේ කියූ කතාවලින් භාග්‍යවතුන් වහන්සේ ව සරණ යාම කොයිතරම් නම් අගනේ ද, කොයි තරම් නම් ආරක්ෂා සහිත ද කියලා හොඳට තේරෙනවා. මේ කථාවන් කියවලා අපි අපේ හිතේ ශ්‍රද්ධාව ඇතිකර ගන්න ඕන භාග්‍යවතුන් වහන්සේව ගුණ වශයෙන් දැනගෙන.

අපි ගෙදර දොර, වැඩපළේ යම් කර්මාන්තයක් කරනා විට ඊට ප්‍රථම ව භාග්‍යවතුන් වහන්සේ ව, ශ්‍රී සද්ධර්මය, ආර්ය මහා සංඝරත්නය යන තෙරුවන් සිහි කළ යුතු ම යි. එවිට අපට තිසරණයේ අනන්ත ආශීර්වාදය ලබා ගන්න පුළුවන්. හැබැයි මේ හැම දෙයක් ම ලැබෙන්නේ තෙරුවන් සරණ යාමෙන් පමණයි. ඒ නිසා, අපටත් තෙරුවනේ අනන්ත ආශීර්වාදය ලබාගන්න, තෙරුවන් සරණ ගොස් ඒ තිසරණය තුළ පිහිටලා පිහිට පිළිසරණ ලබාගන්න වාසනාව උදාවේවා..!

# පාරමිතා

පාරමිතා යනු තුන්තරා බෝධීන් වන බුදු, පසේ බුදු (පච්චේක), රහත් (අරහත්ත), බව ලැබීම සඳහා සම්පූර්ණ කළයුතු දානාදී ගුණදහමිය. බුද්ධ කාරක ධර්ම, බුදුකුරු දහම් යන නම් වලින් එය ද හැඳින් වේ. ප්‍රඥාධික ගණයට අයත් වූ අප මහා බෝසතාණන් අසංඛ්‍ය කල්ප ලක්ෂ හතරක 4 කාලයක් පාරමී දම් පුරා සම්මා සම්බුද්ධත්වයට පත්වූ සේක. තුන්තරා බෝධීන් වන බුදු, පසේ බුදු, මහරහත් බව සඳහා පාරමිතා දහයක් සම්පූර්ණ කළයුතුය. විස්තර වශයෙන් ගත්කල, කොටස් තිහකට 30 බෙදෙන අතර එක් එකක් " පාරමිතා" උපපාරමිතා, පරමාර්ථ පාරමිතා' යනුවෙන් තුන් වැදෑරුම් ය. එවිට දසපාරමිතා තිහක් 30 ගොඩ නැගේ. තමන් සතු බාහිර වස්තු පරිත්‍යාගය, 'පාරමී' වන අතර තම ශරීරයේ ඇස්, කන් ආදී ඉන්ද්‍රියයන් පරිත්‍යාග කිරීම 'උපපාරමිතා' වන අතර, තම ජීවිතය පරිත්‍යාග කිරීම' පරමාර්ථ' පාරමිතා වේ.

බුද්ධත්වය ලැබීම සඳහා දසපාරමිතාව පිරීමේදී, විස්තර කළ පරිදි, එක් එකක් පාරමි, උපපාරමී, පරමාර්ථ පාරමී වශයෙන්, දසපාරමිතා තිහම සම්පූර්ණ කළ යුතු වේ.
දාන පාරමිතාව, ශීල පාරමිතාව, නෙක්ඛම්ම පාරමිතාව, ප්‍රඥා පාරමිතාව, වීර්ය පාරමිතාව, ක්ෂාන්ති පාරමිතාව, සත්‍ය පාරමිතාව, අධිෂ්ඨාන පාරමිතාව, මෛත්‍රී පාරමිතාව, උපේක්ෂා පාරමිතාව, දසපාරමිතාවන්ය. තමන් සතු බාහිර වස්තු පරිත්‍යාගය කරමින්, තම ශරීරයේ ඇස්, කන් ආදී ඉන්ද්‍රියන් පරිත්‍යාග කරමින්, තම ජීවිතය පරිත්‍යාගය කරමින්, 'දසපාරමිතාවෙහි' පළමු පාරමිතාව වන දාන පාරමිතාව කොටස් තුනකින් ද, ශීල පාරමිතාව පුරා ගැනීම සඳහා තමන් සතු - බාහිර වස්තු පරිත්‍යාගය, තම ශරීරයේ ඇස්, කන්, ආදී ඉන්ද්‍රියන් පරිත්‍යාග කරමින්, තම ජීවිතය ද පරිත්‍යාග කරමින් එම කොටස් තුනද සම්පූර්ණ කළ යුතුවේ. මේ ආකාරයටම නෙක්ඛම්ම පාරමිතාව, ප්‍රඥා පාරමිතාව, වීරිය පාරමිතාව, ක්ෂාන්ති පාරමිතාව, සත්‍ය පාරමිතාව, අධිෂ්ඨාන පාරමිතාව, මෛත්‍රී පාරමිතාව, උපේක්ෂා පාරමිතාව ද තුන් වැදෑරුම් වූ තමන් සතු බාහිර වස්තු පරිත්‍යාග කරමින්, තම ශරීරයේ ඇස්, කන්, ආදී ඉන්ද්‍රියන් පරිත්‍යාග කරමින්, තම ජීවිතය පරිත්‍යාග කරමින් දස පාරමිතාව මෙලෙස තිස් ආකාරයකින් සම්පූර්ණකොට අවසානයේ තුන්තරා බෝධීන්ගෙන් පළමු බෝධිය වූ ලොව්තුරා බුදු පදවියට පැමිණේ.

**තම ජීවිතය පරිත්‍යාග කරමින් දස පාරමිතාව මෙලෙස තිස් ආකාරයකින් සම්පූර්ණකොට අවසානයේ තුන්තරා බෝධීන්ගෙන් පළමු බෝධිය වූ ලොව්තුරා බුදු පදවියට පැමිණේ.**

අප මහා බෝසතාණෝ සපුරාලූ සමත්‍රිසෙත් පාරමිතාවන් අතුරෙන් නිදසුන් මෙසේ ගෙනහැර දැක්විය හැකිය.

**දාන පාරමිතාව** - වෙස්සන්තර ජාතකය
**සීල පාරමිතාව** - සංඛපාල ජාතකය (භූරිදත්ත)
**නෙක්ඛම්ම පාරමිතාව** - මඛාදේව ජාතකය
**ප්‍රඥා පාරමිතාව** - උම්මග්ග ජාතකය (සත්තු භත්ත)
**වීර්ය පාරමිතාව** - වණ්ණුපථ ජාතකය, අපණ්ණක මහාජනක ආදී ජාතක
**ක්ෂාන්ති පාරමිතාව** - ක්ෂාන්තිවාදී ජාතකය
**සත්‍ය පාරමිතාව** - සුතසෝම ජාතකය
**අධිෂ්ඨාන පාරමිතාව** - මූපපක්ඛ සහ තේමිය ජාතකය
**මෛත්‍රී පාරමිතාව** - චුල්ල ධම්ම පාල සහ මහා කපි ජාතකය
**උපේක්ෂා පාරමිතාව** - ලෝම හංස ජාතකය

අබුද්ධෝත්පාද කාලවල පහළ වන්නාවූ පසේ බුදු කෙනෙකුන් වීම සඳහා කල්ප කාල ලක්ෂ දෙකක් පාරමීදම් පිරිය යුතු අතර අනුන්ගේ උපකාරයකින් තොරව නිවන කරා පැමිණේ. ලෝකයාට ධර්මය දේශනා කිරීමට සමත් නොවේ. එම පසේ බුදු පදවිය සඳහා දසපාරමිතා කොටස් වශයෙන් විස්සක් 20 පමණක් පිරිය යුතු වේ. එකිනෙක පාරමිතා දහය පිරීමේදී තම බාහිර වස්තු පරිත්‍යාගය, තම ශරීරයේ ඇස් කන් ආදී ඉන්ද්‍රියන් පරිත්‍යාග කරමින් පාරමිතා දහයම එකිනෙක 20 ක් වන සේ සම්පූර්ණ කළයුතු ය. පසේ බුදු තනතුර සඳහා තම ජීවිතය පරිත්‍යාග කිරීම අවශ්‍ය නොවේ. තුන්තරා බෝධීන්ගේ තුන්වන බෝධිය වූ මහරහත් පදවිය සඳහා කල්ප කාල ලක්ෂ එකක් පාරමී දම් පිරිය යුතු අතර, දසපාරමිතා කොටස් වශයෙන් දහයක් පමණක් පිරීම සෑහේ. එකිනෙක පාරමිතා පිරීමේ දී, තම බාහිර වස්තු පරිත්‍යාග කරමින් දසපාරමිතාව සම්පූර්ණ කළ අවසානයේ මහරහත් පදවිය සාක්ෂාත් කරගැනීමට හැකිවේ. මෙලෙසින් දසපාරමිතා සම්පූර්ණ කිරීමෙන්, බුදු පසේ බුදු, මහරහත් භාවයට පැමිණීමේ නිවන් දොරටු විවරවේ. සිල් සමාදන් වීමෙන් ද දසපාරමිතාව සම්පූර්ණ කර ගැනීමට පුළුවන.පොහෝ දින සිල් සමාදන්ව නුවණින් ක්‍රියාකොට 'දසපාරමිතා' සම්පූර්ණ කරගනිමු.

01. **දාන පාරමිතාව**
'මම පරිත්‍යාගශීලී වෙම්වා. මල්පූජා, පහන් පූජා, ගිලන්පස පූජා, ආහාර පූජා කිරීමෙන්, කෙනකුට දානයක් දීම, දානයකට සහභාගී වීමෙන් ද, ධර්ම කථිකයන් වැඩම කරවා බණ කියවීම, තමා බණ කීමෙන් ද, කෙනකුට ඇසෙන සේ බණ පොතක් කියවීමෙන් ද, දාන පාරමිතාව පිරේ.

02. **ශීල පාරමිතාව**
'මම නිර්මල චරිතයක් ඇත්තෙක් වෙම්වා' 'මැනවින් සංවර වෙම්වා. කය - වචනය සංවර කර ගැනීමෙන්, ශිල පාරමිතාව පිරේ. ශීලය සමාදන් වී සිටින නිසා පහසුවෙන් මෙම පාරමිතාව පිරීමට පුළුවන.

03. **නෙක්ඛම්ම පාරමිතාව**
" මම පරාර්ථකාමීත්වය තුළින් ආත්මාර්ථය සලසා ගන්නෙකු වෙම්වා"
අඹුදරුවන්ගෙන් වෙන්ව, ස්වාමියාගෙන් වෙන්ව, රාත්‍රී භෝජනය නොගෙන, අලංකාර වස්ත්‍රාභරණ නොපැළඳ, නැටුම් බැලීම් ආදී දේ වැළකීමෙන්, සුව - පහසු නිවස අත්හැර, දහම් හලකට වී පැදුරක වාසය කිරීම, කාමය කෙරෙන් ඈත්වීමෙන්, නෙක්ඛම්ම පාරමිතාව පිරේ.

04. **ප්‍රඥා පාරමිතාව**
'මම නුවණැති වෙම්වා' 'අනුනට නුවණ දීමට සමත් වෙම්වා' පොහෝ දින ප්‍රඥාව ලැබීමට දහම් නිවැරැදිව ශ්‍රවණය, දහම් පොත පත කියවීම, ධර්ම සාකච්ඡා කිරීමෙන්, තමා දත් ධර්මය අනිත් අයට කියා දීමෙන්, භාවනා කිරීමෙන්, ප්‍රඥා පාරමිතාව පිරේ.

05. **වීර්ය පාරමිතාව**
'මම සිතින් ද කයින් ද වචනින් ද ශක්තිමත් වෙම්වා' 'අනුනට සෙත සැලසීමට සමත් වෙම්වා පොහෝ දින අප ශීලය රැකගැනීමට ධූතංග රැකීම, භාවනායෝගී වීමට, ධර්මය ශ්‍රවණයට, වත් පිළිවෙත් කිරීමට කරන වීර්ය" වීර්යය පාරමිතාවයි.

06. **ඛන්ති පාරමිතාව**
'ක්ෂාන්ති පාරමිතාව' 'මම තරහ නැත්තෙක් වෙම්වා' සිල් සමාදන් ව බඩගින්න ඉවසීම, පිපාසය, ශාරීරික වේදනා ඉවසීම, මැසි - මදුරු කරදර, ශීත උෂ්ණ ඉවසීම, අන්‍යන්ගේ අපහාස ඉවසීම මගින් ක්‍ෂාන්ති පාරමිතාව සම්පූර්ණ කරගැනීමට හැකිවේ.

07. **සත්‍ය පාරමිතාව**
'සච්ච පාරමිතාව' මම සත්‍යවාදී වෙම්වා. අප මේ පොහොය දිනයේ දී සත්‍ය පාවිච්චි කිරීම, සත්‍යයෙහි පිහිටා සිටීමෙන් සත්‍ය පාරමිතාව පිරේ.

08. **අධිෂ්ඨාන පාරමිතාව**
'මම මලක් මෙන් මොළොක් ද ගලක් මෙන් දැඩිද වෙම්වා' අයෝමය චිත්ත බලයක් ඇත්තෙක් වෙම්වා. මම මෙපමණ ශීලය රකිමියි, මෙපමණ කාලයක් භාවනා කරමියි අධිෂ්ඨාන කරගෙන, ඒ අධිෂ්ඨාන කරගත් පරිද්දෙන් මේ පොහොය දිනයන්හිදී එම අධිෂ්ඨානය සම්පූර්ණ කිරීමෙන් මෙම පාරමිතාව පිරේ.

09. **මෛත්‍රී පාරමිතාව**
'මෙත්තා පාරමිතාව' 'මම කාරුණික වෙම්වා' 'දයාබර වෙම්වා' මෙත්සිත් ඇත්තෙක් වෙම්වා. මෛත්‍රී භාවනාව කිරීමෙන්, පහන් දල්වා තැබීමෙන්, සහ අනුන්ගේ යහපත වෙනුවෙන් ඇමදීම් කසළ ඉවත් කිරීම්, පැන් සපයා තැබීම්, ආදී මෛත්‍රී සහගත කායික ක්‍රියා කිරීමෙන් ද, අනුන්ගේ සිත් සතුටුවන පරිද්දෙන්, යහපත් වචන කථා කිරීමෙන්ද, මෛත්‍රී පාරමිතාව පිරේ.

10. **උපේක්ෂා පාරමිතාව**
'මම නිවුණු සැනසුණු සාධාරණ සමතුලිත සිත් ඇත්තෙක් වෙම්වා' පිරීමට අපහසුම පාරමිතාව මෙයයි. අපවිත්‍ර සිරුරකින් හෙබි අපවිත්‍ර රෙදිපිළි හැඳගත්, අය විවිධ ලෙඩ රෝග හටගත්, බැලීමට අපහසු, කැත දුගඳ අවලස්සන අය, පිළිකුල් නොකර සිටිය යුතුයි. සතුරන්ට නපුරුකම් නොකළ යුතුයි. කැත නරක කියන දේ පිළිකුල් නොකර, ලස්සන අයට, හිතවතුන්ට, උසස් අයට, වැඩිපුර ඇල්මක් - සැළකිල්ලක් නොදක්වා, හොඳය කියන දේ වද වැඩි ඇල්මක් නොදක්වා, මේ පෝය දිනයන්හි, සියල්ලන් කෙරෙහ මධ්‍යස්ථව වාසය කිරීමට හැකිනම් උපේක්ෂා පාරමිතාව සම්පූර්ණ කරගැනීමට හැකිවේ.

අපද මේ ධර්ම මාර්ගය තේරුම්ගෙන, මරණයෙන් මෙපිට මේ ගෞතම බුද්ධ සාසනයේදීම, උතුම් වූ චතුරාර්ය සත්‍ය අවබෝධ කරගෙන, අප හැමදෙන පතන බෝධියකින් අමා නිවන ලබාගැනීමට, මේ ධර්මය උපකාරම වේවා...!

# තයෝධම්ම සූත්‍රය

**කරුනු තුන බැගින් වදාල දෙසුම.**

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ජාතිය, ජරාව, මරණය කියන මේ ධර්ම තුන විද්‍යාමාන වෙන්නේ නැත්නම් සම්බුදුරජානන් වහන්සේ කෙනෙක් මේ ලෝකේ පහල නොවන බව මින් නිදහස්වීමට නම් රාග, ද්වේශ, මෝහ ප්‍රහානය කල යුතුයි. ඊට පෙර කල යුතු වන්නේ සෝවාන් වීමයි.

පහල තියන කොටස් 3 මුලින් ප්‍රහානය කල යුතුයි.

**1. සෝතාපන්න වෙන්න නම් මේ කරුනු 3 නැතිකල යුතුයි.**
☞ **සක්කාය දිට්ඨිය** : පංච උපාදානස්කන්ධය මම, මගේ, මගේ ආත්මය යයි ගැනීම.
☞ **සීලබ්බත පරාමාස** : නොයෙක් සිල් ව්‍රත වලට බැඳියාම. කෙනෙක් සිල් රැකලා දෙවියන් බ්‍රහ්මයන් අතර උපදින්න ඕන කියලා සිතනවා.
☞ **විචිකිච්චාව** : තෙරුවන් කෙරෙහි ඇති සැකය

**2. ඉහත කරුනු නැතිකරන්නට පෙර මේ කරුනු 3 නැතිකල යුතුයි.**
☞ **අයෝනිසෝ මනසිකාරය** : සිතට කිසි පාලනයක්, සිහියක්, නුවනින් විමසීමක් නැතුව සිතට එන පරිදි සිතීම.
☞ **වැරදි මග සේවනය** : මිත්‍යා දෘෂ්ටික ඇදහිම්.
☞ සිතේ හැකිලීම.

**3. ඉහත කරුනු නැතිකරන්නට පෙර මේ කරුනු 3 නැතිකල යුතුයි.**
☞ **මුට්ඨ සති** : මුලා සිහිය. සිහිය ඇති කෙනා චතුරාය සත්‍යය දන්නවා
☞ **අසම්පජඤ්ඤය** : නුවන පාවිච්චි නොකිරීම දුක්ඛයක් බව දැනගනී.
☞ **චේතසෝ වික්ඛේපං** : සිතේ විසිරීම, සිතේ නොසන්සුන් බව.

**4. ඉහත කරුනු නැතිකරන්නට පෙර මේ කරුනු 3 නැතිකල යුතුයි.**
☞ ආර්යන් සහ පිරිසිදු ධර්මය කියන අය දකින්න අකමැත්ත.
☞ පිරිසිදු ධර්මය අසන්න ඇති අකමැත්ත.
☞ පිරිසිදු ධර්මය අහන්නේ වැරැද්දක් හොයන්න.

**5. ඉහත කරුනු නැතිකරන්නට පෙර මේ කරුනු 3 නැතිකල යුතුයි.**
☞ අහංකාර කම.
☞ අසංවර කම.
☞ දුස්සීල කම.

**6. ඉහත කරුනු නැතිකරන්නට පෙර මේ කරුනු 3 නැතිකල යුතුයි.**
☞ ශ්‍රද්ධාව නැති කම.
☞ කියනදේ අහන් නැති කම.
☞ කුසීත කම.

**7. ඉහත කරුනු නැතිකරන්නට පෙර මේ කරුනු 3 නැතිකල යුතුයි.**
☞ **අනාදරය** : හිතවත් නැති කම.
☞ **දෝවචස්සතං** : අකීකරු කම.
☞ **පාපමිත්තං** : පාප මිත්‍ර සේවනය.

**8. ඉහත කරුනු නැතිකරන්නට පෙර මේ කරුනු 3 නැතිකල යුතුයි.**
☞ පවට ලැජ්ජා නැති කම
☞ පවට බය නැති කම
☞ ප්‍රමාදය

# මාර ඝාතච්චාවක්

මාර සේනාව පරාජය කළ මහා වීරයාණෙනි ඔබ වහන්සේට
නමස්කාර වේවා !!!
මාගේ සාස්තෘවරයානන් වහන්සේ දිවි පුදා වීර්‍ය වැඩූ අයුරු.......

**තං මං පධානපහිතත්තං - නදිං නේරඤ්ජරං පති**
**විපරක්කම්ම ඣායන්තං - යෝගක්ඛේමස්ස පත්තියා**

නේරංජර ගං තීරේ - පරදුවටම තබා දිවිය
අමා නිවන ලබනු පිණිස - දැඩි ලෙස වෑයම් කරමින්
නිරතුරුවම සමාධියම - වඩමින් සිටිනා මා වෙත

**නමුචි කරුණං වාචං - භාසමානෝ උපාගමී**
**කිසෝ ත්වමසි දුබ්බණ්ණෝ - සන්තිකේ මරණං තව**

කරුණාබර බස් කියමින් - වසවත් මරු පැමිණියේය
අයියෝ ! ඔබ දැන් බොහො ලෙස - විරූපී වී ඇත කෙසගව
සමීපයට පැමිණ සිටී - දැන් නම් ඔබගේ මරණය

**සහස්සභාගෝ මරණස්ස - ඒකංසෝ තව ජීවිතං**
**ජීව භෝ ජීවිතං සෙය්යෝ- ජීවං පුඤ්ඤානි කාහසි**

"මරණය" වෙනුවෙන් ඔබගේ - දහසක් පංගුම පවතී
ජීවත් වන්නට තිබෙන්නේ - එහෙත් එකම පංගුවක්ය
පින්වතල ජීවත් වනු මැන - උතුම් දෙයකි මේ ජීවිතය
ජීවත් වී කළ හැකිමය - ඔබ හට නොයෙකුත් පින්කම්

**චරතෝච තේ බ්‍රහ්මචරියං - අග්ගිහුත්තඤ්ච ජුහනෝ**
**පහූතං චීයතේ පුඤ්ඤං - කිම්පධානේන කාහසි**

ඔබ ඔය සුරකින බඹසර - සමඟ යාග හෝම කළොත්
රැස් කර ගන්නට පුළුවනි - ඔබටත් ලොකු ලොකු පින්කම්
පරදුවටම තබා දිවිය - ඔබ ගන්නා වෑයමෙන්ද
ඔබට තිබෙන පලේ කිමිද?

**දුග්ගෝ මග්ගෝ පධානාය දුක්කරෝ දුරභිසම්භවෝ**
**ඉමා ගාථා භණං මාරෝ - අට්ඨා බුද්ධස්ස සන්තිකේ**

පරදුවටම තබා දිවිය - යන මග නම් අපහසුමය
ඉතාම දුෂ්කර දෙයක්ය - අපහසුමය එල නෙළන්ට
බුදු සමිඳුන් ළඟට පැමිණ - මරු කීයේ මෙම ගාථා

**තං තථාවාදිනං මාරං - භගවා ඒතදබ්‍රවී**
**පමත්තබන්ධු පාපිම - යේනත්ථේන ඉධාගතෝ**

එලෙසින් දොඩනා මරු හට - සමිඳාණෝ මෙසේ කීහ
ප්‍රමාද වූ හැමදෙනාගෙ - මිතුරා වූ පාපිෂ්ඨය
දැන් ඔබ පැමිණියේ මෙතන - ඔය අරමුණ සඳහාමය

**අණුමත්තේනපි පුඤ්ඤේන - අත්ථෝ මය්හං න විජ්ජති**
**යේසං ච අත්ථෝ පුඤ්ඤානං - තේ මාරෝ වත්තුමරහති**

ඉතාම සුළු පිනෙකින්වත් - මා හට දැන් නොමැත පලක්
යම්කිසි කෙනෙකුට පිනෙකින් - වැඩක් තිබේනම් ඔහු වෙත
එයා ළඟට ගොස් මාරය - සුදුසුය ඔය කතා කීම

**අත්ථි සද්ධා තථා විරියං - පඤ්ඤා ච මම විජ්ජති**
**ඒවං මං පහිතත්තම්පි - කිං ජීව මම පුච්ජසි**

මා තුළ මේ කටයුතු ගැන - සද්ධාවද හොඳින් තිබේ
වීරිය හා ප්‍රඥාවද - මා තුළ මැනවින් දිස් වේ
දිවි පුදමින් මේ අයුරින් - මා වෑයම් කරන විටදී
ඇයි ඔබ මට පවසන්නේ - ජීවත් වන්නට කියමින්?

**නදීනමපි සෝතානි - අයං වාතෝ විසෝසයේ**
**කිඤ්ච මේ පහිතත්තස්ස - ලෝහිතං නූපසුස්සයේ**

මගේ සිරුර පිසදාගෙන - හමමින් යන මේ සුළඟට
වියළවන්ට පුළුවනි අර - ගලා බසින සැඩ පහරද
ඉතින් මාත් දිවි පුදමින් - මෙතරම් වෙර වඩනා විට
කිමල මාගේ ලේ දහරද - එසේ නොයාවිද වියළී?

**ලෝහිතේ සුස්සමානම්හි - පිත්තං සෙම්හඤ්ච සුස්සති**
**මංසේසු ඛීයමානේසු - භිය්‍යෝ චිත්තං පසීදති**

භිය්‍යො සති ච පඤ්ඤා ච - සමාධි මම තිට්ඨති
ලේ දහරත් වියළෙන විට - පිතත් සමඟ සෙම වියළේ
ඇඟ මස් සිඳිලා යනවිට - පහන් වේය සිත බොහොසේ
එවිට වැඩෙයි සිහි නුවණද - පිහිටයි මගේ සමාධියද

**තස්ස මේවං විහරතෝ - පත්තස්සුත්තමවේදනං**
**කාමේ නාපෙක්ඛතේ චිත්තං - පස්ස සත්තස්ස සුද්ධතං**

වසන විටදී මේ අයුරින් - පරම වේදනාව දැනේ
එවිට තව තවත් මා සිත - නොපතන්නේමය කාමය
බලාගනුවල මේ ලෙස පවතින කෙනෙකුගෙ පිරිසිදු බවෟ

**කාමා තේ පඨමා සේනා - දුතියා අරති වුච්චති**
**තතියා ඛුප්පිපාසා තේ - චතුත්ථී තණ්හා පවුච්චති**

පළවෙනි සේනාව ඔබේ - ලොවේ තිබෙන කාමයන්ය
කුසල් දහම්වල නොඇල්ම - සේනාවයි ඔබේ දෙවැනි
තුන්වන සේනාව ඔබේ - පිපාසයයි බඩගින්නයි
ලොවම බැඳෙන තණ්හාවට - සිව්වැනි සේනාව කියයි

**පඤ්චමී ථීනමිද්ධං තේ - ඡට්ඨා භීරූ පවුච්චති**
**සත්තමී විචිකිච්ඡා තේ - මක්ඛෝ ථම්භෝ තේ අට්ඨමී**

අලස බවින් යුතු නිදිමත - පස්වැනි සේනාව ඔබේ
සිතේ හැදෙන බීතභූත - හයවෙනි සේනාව කියයි
සදහම් ගැන ඇතිවෙන සැක - සත්වෙනි සේනා පිරිසය
දැඩිබව හා ගුණමකු බව - අටවැනි සේනාව කියයි

**ලාභෝ සිලෝකෝ සක්කාරෝ - මිච්ඡා ලද්ධෝ ච යෝ යසෝ**
**යෝ චත්තානං සමුක්කංසේ - පරේ ච අවජානති**

ලාභද පැසසුම් සැළකිලි - බොරුවෙන් ලබනා යසසද
නවවැනි සේනාව නුඹේ
උස්කොට දක්වමින් තමා - අනිත් අයව පහතට ඇද
මානය යැයි කියනු ලැබේ - මේ දසවැනි සේනාවට

**ඒසා නමුචි තේ සේනා - කණ්හස්සාභිප්පහාරිණී**
**න තං අසූරෝ ජිනාති - ජේත්වා ච ලභතේ සුඛං**

නමුචි ය කෘෂ්ණ ය කියනා - පාපී මාරයල ඔබගේ
ලොව හැමටම පහර වදින - සේනාවේ බලනු රගේ
සූර වීර නැති කෙනෙකුට - දිනා ගන්ට නම් නොහැකිය
එහෙත් දිනා ගත් කෙනාට - හැකිය අමා සැප ලබන්ට

**ඒස මුඤ්ජං පරිහරේ - ධීරත්ථු මම ජීවිතං**
**සංගාමේ මේ මතං සෙය්‍යෝ - යඤ්චේ ජීවේ පරාජිතෝ**

මුදු තණ පත් හිසේ තබා - කියමි සපථ කරමින් මම
කෙලෙස් සහිත සිතකින් යුතු - දිවියට නින්දා වේවා
කෙලෙස් යුද්ධයෙන් පැරදී - ජීවත් වෙනවාට වඩා
මැරී යාම උතුම්ය මට - මේ කෙලෙසුන් හා සටනින්

**පගාළ්හා එත්ථ න දිස්සන්ති - ඒකේ සමණබ්‍රාහ්මණා**
**තං ච මග්ගං න ජානන්ති - යේන ගච්ඡන්ති සුබ්බතා**

ඇතැම් ශ්‍රමණ බමුණු පිරිස - හසුවුන විට මර සෙනඟට
සැබෑ ලෙසම පවතින තතු - දැකගන්නට අසමත් වේ
සදහම් පිළිවෙතින් යුතුව - යායුතු යම් මගක් වේද
නොදනිත්මය ඒ හැමදෙන - අමා නිවන් දෙන ඒ මග

**සමන්තා ධජිනිං දිස්වා - යුත්තං මාරං සවාහිනිං**
**යුද්ධාය පච්චුග්ගච්ඡාමි - මා මං ඨානා අචාවයි**

කොඩිද හාත්පස නංවා - සේනා ඇති මරු පැමිණෙයි

පෙර මග බලමින් මෙහි මම - මරු හා යුදයට පිවිසෙමි
මට හිමි වී තිබෙන තැනින් - කිසිවිට මා නොසැලේවා෴

**යං තේ තං නප්පසහති සේනං ලෝකෝ සදේවකෝ**
**තං තේ පඤ්ඤාය ගච්ඡාමි ආමං පත්තංව අස්මනා**

ලෝකේ දෙව් මිනිසුන් හට - නොහැකිය මැඬලන්නට නම්
ඒ තොපගේ මාර සෙනඟ
එහෙත් දියුණු කළ නුවණින් - මැඬලමි මම මාරසෙනඟ
කළුගලකින් හොඳින් මඩින - අමු වූ මැටි පිඬක් විළස

**වසිං කරිත්වා සංකප්පං - සතිං ච සුප්පතිට්ඨිතං**
**රට්ඨා රට්ඨං විචරිස්සං - සාවකේ විනයං පුථූ**

හැම සිතිවිලි දමනය කොට - මැනවින් පිහිටුවා සිහිය
සැරි සරමින් යන්නෙමි මා - හැම ගමටම හැම රටටම
හික්මවන්නෙමී දහමේ - පින්වත් ශ්‍රාවක ජනයා

**තේ අප්පමත්තා පහිතත්තා - මම සාසනකාරකා**
**අකාමස්ස තේ ගමිස්සන්ති - යත්ථ ගන්ත්වා න සෝචරේ**

මා කියනා දෙය අසමින් - ඒ අයුරින් හික්මෙනු ඇත
නොපමාවෙන් වසන ඔවුන් - පරදුවටම තබා දිවිද
මහත් වීරියක් අරගෙන - නිවන් මගේ බැසගනු ඇත
යම් තැනකට පැමිණුන විට - සෝක තැවුල් කිසිත් නැතිද
නිවන" නමින් යුතු එතැනට - ඔවුන් සියළු දෙන යත්මය

**සත්තවස්සානි භගවන්තං - අනුබන්ධිං පදා පදං**
**ඕතාරං නාධිගච්ඡිස්සං - සම්බුද්ධස්ස සතීමතෝ**

සත් වසරක් මුළුල්ලේම - තබනා හැම පියවරක්ම
සම්දාණන්ගේ පසුපස - හඹාගිය නමුත් කිසිවිට
නොම හැකිවිය අල්ලගන්ට - කිසිම අයුරකින්ම දොසක්
මැනවින් සිහි නුවණ තිබෙන - ඒ බුදු සම්දාණන් තුළ

**මේදවණ්ණංව පාසාණං - වායසෝ අනුපරියගා**
**අපෙත්ථ මුදු වින්දේම - අපි අස්සාදනා සියා**

"මේද තෙලේ පාටින් යුතු - ගල් කුලකට දැක රැවටී
මෘදු බවකින් යුතු මෙහි ඇති - රසවත් බව විඳ ගන්නෙමු
සොම්නස අපි ලබාගනිමු - කියමින් අප සිතට අරන්
ඒ ගල වට කරකැවෙමින් - සිටිනා කපුටෙක් විලසින්"

**අලද්ධා තත්ථ අස්සාදං - වායසෙත්තෝ අපක්කමි**
**කාකෝව සේලං ආසජ්ජ - නිබ්බිජ්ජාපේම ගෝතමං**

ලබා ගන්ට බැරි වූ විට - සිතා ගත්ත කිසි සතුටක්
ඒ ගල්කුල මතම හැපී - පියඹා ඈතට ඉගිලුන
කපුටු මෝඩයෙක් විලසේ - මමත් ගොසින් හැප්පෙන්නට
ගෞතමයන් සමඟ මෙසේ - පැරද පලායන්නෙමු අපි

**තස්ස සෝකපරේතස්ස - වීණා කච්ඡා අභස්සථ**
**තතෝ සෝ දුම්මනෝ යක්ඛෝ - තත්ථේවන්තරධායථාති**

සෝක සිතින් මඩනා ලද - ඒ මරුගේ කිසිල්ලෙන්ද
වීණාව වැටුනා ගිලිහී
දුෂ්ට වූ සිතින් යුතු වූ - ඒ පව් ඇති යක්ෂ තෙමේ
අතුරුදහන් වුණා එහිමග

**පධාන සූත්‍රය**

දස මාර සේනාව

1. කාමය **2.** අරතිය **3.** බඩගිනි සහ පිපාසය **4.** තණ්හාව
**5.** ථීනමිද්දය **6.** බිය **7.** සැකය **8.** දැඩි බව සහ ගුණමකුකම
**9.** ලාභ සත්කාර සහ බොරුවෙන් ලබනා සැලකිලි මම මාර්ගඵල ලාභියෙකැයි හඟවා ලබා ගන්නා සැලකිලි ආදීය෴
**10.** තමා උසස් කොට අන් අයව පහත් කොට ගැනීම෴

# සසර නිමාව සඳහා කල හැකි පින්කම්.

- බුදු ගුණ මෙනෙහි කිරීම
- දම් ගුණ මෙනෙහි කිරීම
- සඟ ගුණ මෙනෙහි කිරීම
- අනුන් කළ මහා පින්කම් අනුමෝදන් වීම්
- නිති පන්සිල් සමාදම් වීම
- පන්සිල් කඩ නොකොට රැකීම
- උදේ සවස බුදුන් වැඳීම
- අට සිල් සමාදන් වී රැකීම
- නවංග සීලය සමාදන් වීම
- දස සිල් සමාදම් වීම
- පසලොස්වක පෝයට සිල් සමාදම් වීම සහ හතර පෝයට සිල් ගැනීම්
- භාවනා කිරීම හා අනෙකුත් අය ද ඒ සඳහා යොමු කිරීම්
- ධර්ම දානය (මුහුණු පොතේ වෙබ් අඩවියේ ආදියේ ධර්මය බෙදා හැරීම)
- ධර්මය මුද්‍රණය කර බෙදා හැරීම
- ධර්මය කියවීම
- වතාවත් කිරීම (පන්සලේ ශ්‍රමදානයක් කිරීම ආදිය)
- දුගීව සිටද හැකි පමණින් බුදුරජාණන්වහන්සේ ට දානපති දානයක් පූජා කිරීම (තමා පරිභෝජන කරනවාට වඩා උසස් දෙයක් පූජා කිරීම
- දුගීව සිටද හැකි පමණින් මහා සංඝරත්නයට දානපති දානයක් පූජා කිරීම (තමා පරිභෝජන කරනවාට වඩා උසස් දෙයක් පූජා කිරීම
- පින් දීම
- සත්‍ය කථා කිරීම
- දෙලොවටම වැඩ ඇති වචන කථා කිරීම
- හිස් වචන කතා නොකිරීම
- සත්පුරුෂයන් කරනා පින්කම් ප්‍රචාරය කර දීම
- ගිලානෝපස්ථානය
- පහන් සිතින් යුතුව මල් ආසන සෝදා සුද්ධ පවිත්‍ර කිරීම
- මල් පූජා කිරීම
- ලෝක සත්වයා හට මොහොතක් හෝ මෙත් වැඩීම සහ මෙත් පැතිරවීම
- ඇවිදින හැම පියවරක් පාසා සුවපත් වෙත්වා යැයි මෙත් වැඩීම සහ පැතිරවීම
- දවසකට එක ධර්ම ලිපියක් ලිවීම හෝ කියවීම හෝ අනිත් අයට කියවීමට අවස්ථාව ලබා දීම
- ධර්මය හැදෑරීම
- අනිත් අයගේ ධර්ම ගැටලු වලට ත්‍රිපිටක අටුවාව ටීකාව ඇසුරින් පිලිතුරු සෙවීම සහ පිලිතුරු ලබාදීම
- අභිධර්මය හැදෑරීම
- ධර්මය දැනගැනීමට තියෙන උවමනාව උනන්දුව වැඩි කරගැනීම
- ධර්මය වන පොත් කිරීම වන පොත් කල ධර්මය අර්ථය මෙනෙහි කරමින් සජ්ඣායනය කිරීමට පුරුදු වීම
- නෙක්කඛම්මය

සෑම ආහාර වේලකදීම එක් ආහාර පිඩක් අනුභයෙන් අවසන්ව යම් ජීවියෙකුට ආහාර වේවායැයි පතා පසෙකින් තබන්නි පලමු පිඩ තැබීමෙන් වලකින්න ඒ අවස්ථාවේදී ආනිශංස 200 ක් සිදුවෙන බව ධර්මයේ සදහන් එම ක්‍රියාව වේල් 3 ම කිරීමෙන් දිනකට කරගත හැකි පින සුළුපටු නොවේ

**උපුටා ගැනීමකි !**

# සය ආකාර රහතන් වහන්සේලා

අර්හත් මාර්ග නුවණින් කෙළෙසුන් නැසූ සය ආකාරයක රහතන් වහන්සේලා වැඩ සිටී. ඒ සය ආකාර රහතන් වහන්සේලා නම් :-

**1. ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේ**

ධ්‍යාන උපදවා නොගෙන කෙළින්ම විදර්ශනා වඩා කෙළෙසුන් නැසූ රහතන් වහන්සේලා. කිසිදු අභිඥා බලයක් නොමැත.

**2. ත්‍රිවිද්‍යා ප්‍රාප්ත රහතන් වහන්සේ**

ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේට වඩා ධ්‍යාන උපදවාගෙන අෂ්ට සමාපත්තිලාභීව ත්‍රිවිධ්‍යා උපදවා ගත් රහතන් වහන්සේලාග එම ත්‍රිවිද්‍යා නම් :-

i. පුබ්බේ නිවාසානුස්සති ඥාණය පෙර භවයන් ආවර්ජනය කිරීමේ නුවණ.
ii. චුතූපපාත ඤාණය සත්වයාගේ චුතිය හා උත්පත්තිය දක්නා නුවණ.
iii. ආසවක්ඛය ඥානය කෙලෙස් සහමුලින්ම දුරු කිරීමේ නුවණ.

**3. ෂඩ් අභිඥාලාභී රහතන් වහන්සේ**

ත්‍රිවිද්‍යා ප්‍රාප්ත රහතන් වහන්සේලාට වඩා ධ්‍යාන උපදවාගෙන අෂ්ට සමාපත්තිලාභීව ෂඩ් අභිඥා උපදවා ගත් රහතන් වහන්සේලා. ෂඩ් අභිඥා :-

- ඉද්ධිවිධ ඤාණය
- දිබ්බසෝත ඤාණය
- පරචිත්තවිජානන ඤාණය
- පුබ්බේනිවාසානුස්සති ඤාණය
- චුතූපපාත ඤාණය
- ආසවක්ඛය ඤාණය



**4. සිව්පිලි සිඹියාපත් මහරහතන් වහන්සේලා**

ෂඩ් අභිඥාලාභී රහතන් වහන්සේලාට වඩා ඥාණ මට්ටමින් වැඩි සිවුපිලිසිඹියාපත් මහරහතන් වහන්සේලා

- අර්ථ • ධර්ම • නිරුක්ති
- පටිභාන යන ඥාණ හතර සහිතව රහත් බවට පත් වූ සිවුපිලිසිඹියාපත් මහරහතන් වහන්සේලා.

**5. අසූ මහා ශ්‍රාවක මහ රහතන් වහන්සේලා**

සිව්පිලි සිඹියාපත් මහ රහතන් වහන්සේලාට වඩා ඥාණ මට්ටමින් ඉහල පෙර බුදු පියාණන් වහන්සේලා ළඟ විවරණ ලැබූ සහ කල්ප ලක්ෂයක් පමණ පාරමී දම් සම්පූර්ණ කළ. අසූ මහ ශ්‍රාවක රහතන් වහන්සේලා.

**6. අග්‍ර ශ්‍රාවක මහ රහතන් වහන්සේලා**

අසූ මහා ශ්‍රාවක මහ රහතන් වහන්සේලාට වඩා අසංඛ්‍ය එකකුත් කල්ප ලක්ෂයක් පාරමී දම් පිරූ-ඥාණ මට්ටමින් වැඩි අග්‍ර ශ්‍රාවක මහ රහතන් වහන්සේලා.

සද්ධර්ම ප්‍රතිරූපක සූත්‍ර වර්ණනාවේ මෙසේ සඳහන් වේ.

"ප්‍රථම සම්බෝධියෙහි (බුද්ධත්වයට පත්වූ අලුත) භික්ෂූන් සිවුපිලිසිඹියාපත් වූහ. ඉක්බිති කල්ගත වනවිට සිවුපිලිසිඹියාපත් වීමට නොහැකිව ෂඩ් අභිඤ්ඤා ඇත්තෝ වූහ. ඒ සඳහා ද අසමත් වූ පසුකාලීන භික්ෂූහු ත්‍රිවිද්‍යා උපදවාගත්හ. දිගු කලකට පසු ඊට ද අසමත් වූ බැවින් ආසවක්ඛය ඤාණය පමණක්ම ලබා ගැනීමට දක්ෂ වූහ. එයද නොහැකි වූ කාලයෙහි අනාගාමී ඵලය පමණක් විය. අනාගාමී වීමට නොහැකි වූ විට සකදාගාමී ඵලයට පත්වූහ. ඊටද අසමත් වූවෝ සෝව-

---

**මෙත්සවිය මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදයේ නිර්මාතෘ මහාචාර්ය චන්දන ජයරත්න මහතාගේ උදාර සංකල්පයක් ලෙස ඇරඹි තථාගත සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ භික්ෂු ශාසනයේ ආරක්ෂාව සහ චිරස්ථිතිය උදෙසා ශාසනයට ඇතුලත් වීමට අපේක්ෂාවෙන් සිටින,**

අඩු ආදායම් සහිත පවුල්වල ළමුන් පැවිදි කරගැනීම.

- කැපකරු ක්‍රමය ක්‍රියාත්මක කිරීම (ශිෂ්‍යත්ව).
- කළුතර ප්‍රදේශවාසී කුඩා දරුවන් සඳහා පෙරපාසැල් අධ්‍යාපනය ලබාදීම සහ අසරණ සරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- මෙත්සවිය ධර්මදූත ඒකකය ස්ථාපිත විහාරමහාදේවී පිරිවෙනෙහි අධ්‍යාපනය ලබන
- ස්වාමීන්වහන්සේලාට ශිෂ්‍යත්ව ලබාදීම/ අනුග්‍රහය දැක්වීම යනාදිය සඳහා මෙත්සවිය සාමාජිකයින් වන ඔබටද දායකවිය හැකි බව ඉතා කාරුණිකව මතක් කර සිටිමු.

**තෙරුවන් සරණයි..!**

දුරකථන අංකය: 0701558558
මෙත්සවිය පිරිවෙන් සහ පෙරපාසල් සම්බන්ධීකාරක

# දස වස්තුක මිත්‍යා දෘෂ්ඨිය



1.**'නත්ථි දින්නං'**
දුන් දේ විපාකයක් නෑ කියලා කෙනෙක් හිතනවා නම් එය මිථ්‍යා දෘෂ්ඨියක්.

2.**'නත්ථි යිට්ඨං'**
පූජා සත්කාර වැඳුම් පිදුම් කිරීමේ විපාකයක් නෑ කියලා හිතන-වා නම් එය මිථ්‍යා දෘෂ්ඨියක්.

3.**'නත්ථි හුතං'**
මහා පරිමාණයෙන් කරන පූජා සත්කාර ආදියේ ආනිශංස නෑ කියලා හිතනවා නම් එය මිථ්‍යා දෘෂ්ඨියක්.

4.**'නත්ථි සුකට දුක්කටානං කම්මානං ඵලං විපාකෝ'**
හොඳක් කළොත් හොඳ විපාක. නරකක් කළොත් නරක විපාක නෑ කියලා හිතනවානම් එය මිථ්‍යා දෘෂ්ඨියක්.

5.**'නත්ථි අයං ලෝකෝ'**
අපට ලෝකයක් නෑ, ඒ කියන්නේ මේ ලෝකය සදාකාලිකයි .මේ ලෝකයේ අප ඉන්න ටිකේ හොඳට කාලා බීලා සතුටින් ඉමු කිය කියා හිත හිතා කටයුතු කරනවා නම් එතැන තියෙන්නේ මිථ්‍යා දෘෂ්ඨියක්.

6.**'නත්ථි පරලෝකෝ'**
මේ ලෝකයට පස්සේ අපට නැවත උප්පත්තියක්, පරලොවක් නෑ කියලා හිතනවා නම් එයත් මිථ්‍යා දෘෂ්ඨියක්.

7.**'නත්ථි මාතා'**
අම්මාට උපස්ථාන කිරීමෙන් අපට ආනිශංස නෑ. අපට වැඩක් නෑ ප්‍රයෝජනයක් නෑ. කියලා හිතනවා නම් එයත් මිථ්‍යා දෘෂ්ටියක්.

8.**'නත්ථි පිතා'**
පියාණන්ට උදව් කිරීමෙන්, උපස්ථාන කිරීමෙන් අපට ප්‍රයෝජනයක් නෑ. විපාකයක් නෑ කියලා හිතනවා නම්, එයත් මිථ්‍යා දෘෂ්ඨියක්.

9.**'නත්ථි සත්තා ඕපපාතිකා'**
මේ ලෝකයේ ඕපපාතික සත්වයන් නෑ කියලා හිතනවා නම්, විශේෂයෙන් ම ඕපපාතික දෙවියන්, ඕපපාතික බ්‍රහ්මයන්, ඕපපාතික අසුරයන්, ඕපපාතික නාගයන්, ඕපපාතික නිරයගත සතුන් පිලිබඳවත්, විශේෂයෙන් මනුස්සයන් ගැනත් විශ්වාසයක් නැත්නම් එයද මිථ්‍යා දෘෂ්ඨියක්. අපේ බුද්ධ කාලයේ ඕපපාතික ලෙස දෙන්නෙක් පහළ වෙලා තිබෙනවා. විංචිමානවිකාව පහළ වුණේ සැවැත්නුවර සියඹලා ගසක් යට. අම්බපාලි ගණිකාව විශාලා මහනුවර ලිච්ඡවී දරුවන්ට අයිති අඹ උද්‍යානයේ තිබෙන අඹ ගසක් යට අම්මා කෙනෙක් තාත්තා කෙනෙක් නැතිව අවුරුදු (16-18) කියන තරුණ වයසේ දී පහළ වුණා. මෙන්න මේක තමයි ඕපපාතික උප්පත්තිය. එත-කොට ඒවාගේ උප්පත්තියක් ගැන විශ්වාසයක් නැතිනම් මිථ්‍යා දෘෂ්ඨියක්.

10.**'නත්ථි ලෝකේ සමණබ්‍රාහ්මණා සම්මග්ගතා සම්මාපටිප න්නා යෙ ඉමංච ලෝකං පරං ච ලෝකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා පවේදේති'**
මේ ලෝකයේ යහපත් මග කියාදෙන නිවැරැදි මාර්ගය පෙන්වා දෙන සිල්වත්, ගුණවත්, උතුමන් බ්‍රාහ්මණයන් නෑ කියලා කෙනෙක් හිතනවා නම් එයත් මිථ්‍යා දෘෂ්ඨියක්.

**මජ්ඣිමනිකාය - උපරිපණ්ණාසකෝ - අනුපදවග මහාචත්තාරීසක සුත්තං**

# Benefits of practicing mindfulness

The concept of mindfulness was captured by all regions in the world, despite of its origin. This theme could be first observed in Lord Buddha's teachings, and present cultivation done by Kabat Zinn (2017). According to novel definition mindfulness is an awareness that arises through paying attention, on purpose, in the present moment, non-judgmentally; and then sometimes add, in the service of self-understanding and wisdom.

Integration of mindfulness to our daily living has multiple benefits as follows.

- Stress relief and relaxation-It lowers your blood pressure when you are tensed and put to a relaxed mode.
- Boost your immunity.
- Emotional awareness- This enables the self-awareness as well as social awareness
- Thought regulation- This enables to identify both positive and negative thoughts within you
- Loving kindness and compassion-Learn to do both self-love and compassion for others
- Empathy- Ability to understand and share the feelings of others ^iylпmkh&
- Effective communication skills
- Good rapport building in your professional life.

Home practice of various techniques of mindfulness will bring you a novel avenue to your life!

Dr. Dhananja Illangasinghe
(Membership No : 34-5277)
Suwasetha Committee

# පුණ්‍යානුමෝදනා

**පහත වැඩසටහන් සඳහා ආධාර පරිත්‍යාග ලබා දුන් සුපිංවතුන් හට මේ කරගත්තා වූ කුසලය නිවන් දක්නා ජාති දක්වා ම ඔබ පසුපස එන සෙවනැල්ල සේ පවතීවායි ප්‍රාර්ථනා කරන්නෙමු !**

**මෙත් සවිය කන්තා කමිටුව මගින් භාවනා වැඩසටහනට සහභාගී වන යෝගීන් හට ගිලන්පස / තේ පැන් සැපයීමේ පුණ්‍යකර්මයට දායකත්වය ලබා දුන් සුපින්වතුන්.**

2024.01.07 - අනෝමා ලියනආරච්චි මිය
සෝමා දීගල්ල මිය
සඳමාලි ජයසිංහ මිය
පියුමි සායක්කාර මිය
2024.01.14 - චූලා,සමන්මලී,නාමලී යන මහත්මීන්
2024. 01.21 - ජී.ඩබ්.උදයකුමාර මයා,
ඊ.උපේකා අප්සරා මිය
නිරන්ජිකා පතිරගේ මිය
මාලින්ද ප්‍රසාද් මයා
නිරෝෂා සෙව්වන්දි මිය
කේසලා,පුෂ්පා,මානෙල් මිය
2024.01.28 - විශ්වනාත් අපොන්සු මහතා
2024.02.11 - නිලූකා ජයසිංහ මිය
2024.02.18 - මාලනී මුදුන් කොටුව මිය
2024.02.25 - පණ්ඩුල මහතා
අසරණ සරණ කණ්ඩායම
2024.03.03 - මාලා හෙට්ටිආරච්චි මිය
සීතා මාලනී මයා
සුරත් චතුරංගමයා
ඔනෙල් චන්තු හේවාමයා
මෙනුර ඩයස් මයා මේනකා ජයවර්ධන මිය
2024.03.10 - හේමන්ති පෙරේරා මිය
2024.03.17 - තරුණ කමිටුව
එ ණ.උ.ප්‍රින්ස් මිය
ඉශාන් හෙට්ටිආරච්චි මයා
සංජය සේනාධීර මයා
2024.03.31 - නදී ගුණසේකර මිය
2024.04.07 - ප්‍රියානි මුණසිංහ මිය
2024.04.21 - වික්‍රම ගුණදාස මහතා
2024.04.28 - චින්තක බණ්ඩාර මහතා

**2024 ජනවාරි 01 දා හුණුපිටිය ගංගාරාම පන්සලේ දානමය පිංකම සඳහා දායකත්වය**

මහාචාර්ය චන්දන ජයරත්න මැතිතුමා
සහනි ඇල්පිටියගේ
රංගනී අපොන්සු
චමරී යාපා
අතුල නානායක්කාර
දිලූෂි
හිරාන්
ධම්මිකා මංචනායක
කුමුදුනි ජයතිලක
නෙරංජලා
ශාන්ති
ලතා පද්මිණී
නන්දා ජයවර්ධන
නිසංසලා
ජයන්ති කරදගොඩ
ධම්මිකා
නිලක්ෂි ගුණසේකර
සුනිල් හේවාවසම්
සඳමාලි ජයසිංහ
චතුර ජයසිංහ
තුසිත වීරක්කොඩි
පද්මකුමාර ජයසිංහ
ඉසුරි රම්මාවඩු
දිනුකා
පියුමලි සායක්කාර
වසන්ත වීරසේකර
නිසංසලා
කරුණාදාස
අචිනි රණසිංහ
පුණ්‍යා නිශාන්ති කළුතන්ත්‍රි
දීප්ති බණ්ඩාර
පුෂ්පකාන්ති පෙරේරා.
නේපාලි
කමනි ජයකොඩි
නිමේෂ් සශඉන්ත
තනුජා හෙට්ටිආරච්චි
ඉනෝකා කොතලාවල
ප්‍රියලාල්
ශිරාණි ජයමහ
හේමා ලියනගේ
චන්ද්‍රලතා
ඨ.උ.වික්‍රමතුංග
මියුරියල් පෙරේරා
හේමන්ති පෙරේරා
නිර්මලා
දෙළුම්වත්ත
ජී.විජේතුංග
ලසන්ති වීරසිංහ
සෝමා දීගල්ල
තිළිණ
නදුන්
ඨ.එ.ඕ.ගජනායක
පියසීලි පෙරේරා
සුරංජිත්
රුෂාන්ති දසනායක
කුමුදුනි අබේකෝන්
පියල්
විශ්වනාත් අපොන්සු
තමරා සමරවීර
විරාජ්
පී.පී.පෙරේරා
රංජනී උදුගොඩ යන මහත්ම මහත්මීන්ගේ දායකත්වය ලැබුණි.

**සියළු දෙනාටම උතුම් චතුරාර්ය සත්‍යය අවබෝධය පිණිස මේ පුණ්‍ය කර්මය හේතු වේවා**

මෙවර සංවත්සර මහා සමුළුව පැවැත් වීම සඳහා ශාලා ගාස්තු
වශයෙන් රු 50,000/= ක මුදලක් ශිරන්ත ඉලංගරත්න මහතා විසින්
බැතිබර දායකත්වය ලබා දී ඇත.

# නිවේදන සහ නොමිලයේ පළකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

මෙත්සවිය පුවත් සගරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපිද, දාන - ශීල - භාවනා වැඩසටහන්වල දී දායකත්වය දරන පිංවතුන් ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන් ද සගරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිලයේ පලකරනු ලැබේ. කොළ කැබලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තැබිය යුතුය. ඔබගේ ලිපිනය ලියා දිම සඳහා භාවනා වැඩසටහන්වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවල ද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන් කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සගරාව තැපෑලෙන් නොලැබී යාම පිළිබඳව වගකියනු නොලැබේ.

## මෙත් සවිය දුරකතන අංක

මෙත් සවිය තොරතුරු විමර්ශනය කරනවිට, **පරිපාලන නිලධාරී මහතා අමතන්න. (011-2505088, 0714-014467).** එම දුරකතනවල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි.

අපගේ **වෙබ් අඩවි වන www.methsaviya.org** සහ **www.methsaviya.lk** මගින්ද තොරතුරු ලබා ගත හැකිය.

මීට අමතරව සම ලේකම්වරු වන මංජුල පත්මකුමාර මහතා (071 529 5855) / පියල් චන්ද්‍රතුංග මහතා (071 450 1358) අමතා ද හදිසි තොරතුරු සඳහා වෙබ් කමිටු සභාපති චින්තක බණ්ඩාර මහතා (0718 114 477) අමතා තොරතුරු ලබාගත හැක.

සංසදයේ **සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක 0714 800 800 හෝ 0777 309 385** මගින් **දහවල් 12.00 - 1.00 ත් අතර හෝ රාත්‍රී 9.00 - 10.00 ත් අතර පමණක්** (ඉතා හදිසි අවශ්‍යතාවයක දී සෑම වේලාවක) සිදු කරන්න. (දිනකට දුරකථන පණිවුඩ 30 ක් පමණ ලැබෙන නිසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදුකරන්නේ නම් මැනවි.)

## මීළඟ 51 වන භාවනා වැඩසටහන

51 වන භාවනා වැඩසටහන 2024 ජුලි මස 28 වන ඉරු දින ඇරඹීමට නියමිතය. ඒ සඳහා 2024/07/14 දින තෙක් නව අයදුම්පත් භාරගනු ලැබේ. ඉන්පසු ලැබෙන අයදුම්පත් ද ඉඩකඩ තිබුනහොත් සලකා බලනු ලැබේ. තවද සාමාජිකත්වය අළුත් කරගත් පැරණි සාමාජිකයින්ට ද ඒ සඳහා සහභාගි විය හැක. සාමාජිකත්වය අළුත් කරගන්නා විට භාවනා වැඩසටහනට පැමිණෙන/නොපැමිණෙන බව කාර්යාලයට දන්වන්න.

## පංච අභිඥා සහ අධිමානසික විද්‍යාව පිළිබඳ 48 වන වැඩමුළුව

ප්‍රායෝගික අධිමානසික විද්‍යාව සහ පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ 48 වන වැඩමුළුව 2024 - 06 - 23 වන ඉරු දින පෙරවරු 10.00 ට ආරම්භ වේ. 48 වන වැඩමුළුව සඳහා අයදුම්පත් 2024 - 06 - 16 දිනට පෙර භාරදෙන්න. ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මූලිකත්වය ලබා දේ.


**T.S.H.TECHNOLOGIES**

**පරිගනක, රූපවාහිනී**
**අලුත්වැඩියාව / ශබ්දවාහිනී**
**උපකරණ නිපදවීම සහ**
**නව නිර්මාණ කරණය**
**071 66 00 317**
(සාමාජික - 43 කණ්ඩායම)

**ගණකාධිකරන හා මුල්‍ය සේවා**

පලපුරුදු, වෘත්තීය ගණකාධිකාරීවරයෙකු වන
මෙත්සවිය සාමාජිකයකු තනි පුද්ගල/ හවුල් ව්‍යාපාර,
සමාගම් ඇතුළු සියලු ව්‍යාපාරවල විගණනය,
ගිණුම් පිලියෙලකිරීම්,
ආදායම් බදු හා මුල්‍ය කළමනාකරණ උපදෙස් හා
සේවාවන් සාධාරණ ගාස්තු යටතේ සපයනු ලැබේ.
**විස්තර : 077 2355117 අමතන්න.**

**දිදුලක ක්‍රියේෂන්ස්**

විසිතුරු නිර්මාණ සමගින් අලංකාරවත් ලෙස
**මුතුකුඩ නිර්මාණය**
මනාලියන්ගේ සහ උත්සව අවස්ථාවන් සඳහා
**සාරි නිර්මාණය කරනු ලැබේ**
**සාමාජිකා - දිලිනි**
බොරලැස්ගමුව - **0773904405**

ප්ලාස්ටික් ප්‍රතිශක්තිකරණය කර
පිගන්/ කෝප්ප / වට්ටි ආදිය තැනීම රැකියාව කරගත්
සාමාජිකාවකට (සා.අංක. 34-5228) නැගී සිටීමට අතහිත දෙන්න...
**ඔබ නිවසේ විසිකරන අනවශ්‍ය ප්ලාස්ටික් ද්‍රව්‍ය තිබේ නම්**
**පොල්තෙල් බෝතල්/අයිස්ක්‍රීම් පෙට්ටි/ වතුර බෝතල් ආදිය**
**භාර දීමට විමසන්න - 0772 353 392**

**සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්**
**SIGHT 'N' STYLE OPTOMETRISTS**



නො. 126 බී, හයිලෙවෙල් පාර, නුගේගොඩ.
(අනුලා විදුහල ඉදිරිපිට) දුරකථන : 2854758
**(සියලුම වර්ගයේ ඇස් කණ්නාඩි අවශ්‍යතා සඳහා විමසන්න)**

**ජල රකුසාගෙන් ගැලවෙමු** ග්‍රන්ථය
**කර්තෘ : පියදාස සිල්වා** (සා:අ: 15-2738)




- භාවනාව • ධර්ම දානය
- අභය දානය සඳහා කියවන්න

★ දියේ ගිලීමට ★අමනුස්ස බලපෑම්
★ අකල් මරණ අවමයට
★ ඇමෙරිකාවත් මෛත්‍රී භාවනාවට
★ ලොව ඉහළම කුසලයට
★ බුදුන් වහන්සේට මල් පිදීම තුලින් ...

**මුද්‍රණ වියදම රු. 350**
**අලෙවි මිල රු. 250**
දු:කා: 075 712 8960

**පසුගිය වසරේ ලද සියළු පරිත්‍යාග බුදු පිළිමය තැනීම සඳහා පිරිනමන ලදී**

**මැහුම් කලාව**
**පුහුණු කිරීම**



මැහුම් කලාවේ සුන්දරම නිර්මාණය වූ, **රිබන් මෝස්තර නිර්මාණ සහ බ්‍රසීලියන් එම්බ්‍රොයිඩර් පුහුණු කිරීම. නිවස අලංකාරයට බිත්ති සැරසිලි, කුෂන් කවර, මේස රෙදි ආදී බොහෝ දෑ සමඟ කුඩා ළමා ඇඳුම් සිට බිලවුස් සහ සාරිය දක්වාත්,**
නිවැරදි ලෙස වර්ණ සංකලණය කරමින් සොබා දහමේ සුන්දරත්වය එලෙසින්ම රැකෙන පරිදි
ඉතා සියුම් නිර්මාණ පුහුණු කරණු ලැබේ.
**නිමැවුම් භාර ගැනීම සඳහා ද විමසන්න. 077 542 1001**
(ළමා නිවාසවල දැරියන්ට ශක්තියක් වීමට නොමිලේ පුහුණුව දීමට කැමැත්තෙමි)

# මෙත් සවිය මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය - සාමාජික අයදුම්පත

**(ඡායා පිටපත් ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)**

01. සම්පූර්ණ නම ..............................

02. ස්ත්‍රී / පුරුෂ භාවය .............................. 3. ජාතික හැඳුනුම්පත් අංකය (ඡායා පිටපතක් අමුණන්න) ..............................

04. උපන් දිනය .............................. 5. වයස .............................. 6. ආගම ..............................

07. ස්ථිර ලිපිනය ..............................

විද්‍යුත් තැපෑල (e-mail) .............................. දු:ක: නිවස .............................. ජංගම ..............................

Whatsapp අංකය ..............................

08. දිස්ත්‍රික්කය .............................. 9. විවාහක / අවිවාහක බව ..............................

10. දරුවන් සිටිනම් විස්තර : ගැහැණු දරුවන්ගේ වයස් .............................. / පිරිමි දරුවන්ගේ වයස් ..............................

11. රැකියාව හා තනතුර ..............................

ආයතනයේ නම ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්නේ නම් මැනවි) ..............................

12. කාර්යාලීය විස්තර හා දුරකථන විස්තර ..............................

13. ලිපි එවිය යුතු ලිපිනය ..............................

14. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්,

1. ..............................
2. ..............................

15. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර,

1. ..............................
2. ..............................
3. ..............................

16. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇදුම, හෘද රෝග, දියවැඩියාව, රුධිර පීඩනය, අපස්මාරය) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර ..............................

17. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද ? ඔව් / නැත .

18. එවැනි මානසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර.

..............................

19. ඔබ විසින් සඳහන්කළ යුතු මෙහි දී වැදගත් යැයි හැඟෙන වෙනත් විස්තර හෝ යෝජනා / අදහස් තිබේ නම් මෙහි සඳහන් කරන්න. ..............................

..............................

**මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.**

දිනය .............................. අයදුම්කරුගේ අත්සන ..............................

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

තේරීම් කමිටුවේ තීරණය

සාමාජික අංකය ..............................

.............................. ..............................

තේරීම් කමිටු සභාපති විධායක ලේකම් දිනය ..............................

සැ:යු:- ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශන, වැඩමුළු, මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශන ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම්, හැඳුනුම්පත් සැකසීම, තැපැල් ගාස්තු, විදුලි ගාස්තු, කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිළධාරි මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනීම සඳහා රු. 6,000 /- ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය. (එය ඇතුළත්වීමේ ගාස්තුව රු. 5,000 /- හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500 /- X 2 වශයෙනි). මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායම් ලබන පවුල්වල අය සඳහා තම ආදායම තහවුරු කළ හැකි ලිපි ලේඛන සහ තම විහාරස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ නිර්දේශය සහිත ග්‍රාම නිලධාරීතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත් බව දැන්වූවාට පසුව පමණක් සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ) කාර්යාලය අඟහරුවාදා, බදාදා හැර සතියේ ඉතිරි දිනයන්හි සෙනසුරාදා, ඉරිදා ඇතුලුව සතියේ දින 5 ක් විවෘතව පවතී. අයදුම් කරන සෑම කෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍යනම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ 9X4 ප්‍රමාණයේ නම, ලිපිනය ලියූ මුද්දර කවර 2 ක් සමඟ පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් යොමු කරන්න. (අයදුම්පත සමඟ කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ.)

ගරු ලේකම්, මෙත්සවිය, අංක 55, ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08. දුරකථන : 0112 505088, 0714 014467

**සියළු සාමාජිකයින් සඳහා නොමිලේ පැවැත්වෙන ආධ්‍යාත්මය දියුණු කිරීමේ චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන් වලට අමතරව ධර්ම දේශනා, විශේෂ දේශන, සාර්ථකව ඉගෙන ගන්නා අන්දම පිළිබඳ වැඩමුළුව, අක්ෂි සායන, වෛද්‍ය සායන වලට සහභාගී වීමට අවස්ථාව සහ පුස්තකාල පහසුකම් හිමිය. මෙත් සවිය සඟරාව නිවසටම තැපෑලෙන් එවන අතර වාර්ෂික දින දර්ශනය ද නොමිලේ මෙත් සවිය මගින් ලබා දේ. මියගිය සාමාජිකයින් සඳහා වාර්ෂිකව සංඝගත දක්ෂිණාවක් පවත්වා පිං අනුමෝදන් කිරීම ද සිදු කෙරේ.**



# 2024

## 2024 මාර්තු 03 වන දින
## කොළඹ,විශ්ව විද්‍යාලයේ විද්‍යාපීඨ පරිශ්‍රයේ
## නව කලාගාරයේ ශාලාවෙහි පැවැත් වූ,

# අධ්‍යාපනික වැඩමුළුව


















මෙත්සවිය
මනස අධ්‍යාපන සංවර්ධන
මෛත්‍රී සංසදයේ නිර්මාතෘ
විද්‍යා කීර්ති, ශාසනදීපන,
ලෝකාර්ථචාරී,විද්‍යාවාචස්පති,
විශ්ව විද්‍යා අධිමනෝවිද්‍යාවේදි,
නාලන්දා කීර්ති ශ්‍රී දේශමාන්‍ය මහාචාර්ය
චන්දන ජයරත්න මැතිඳුන්
මෙත්සවිය ත්‍රෛමාසික භාවනා
වැඩසටහන් 50ක් පවත්වා
මෙත්සවිය සාමාජික සාමාජිකාවන්
7500 කට ආසන්න පිරිසකට
ධර්මාවබෝධය ලබාදීම ඇතුළු
එතුමන් විසින් ඉටුකරන ලද
උදාර ජාතික, ආගමික, ශාසනික
සහ සමාජසේවා
යුග මෙහෙවර අගය කරමින්
මෙත්සවිය මනස අධ්‍යාපන
සංවර්ධන මෛත්‍රී සංසදයේ
සමස්ථ සාමාජික සාමාජිකාවන් විසින්
2024 අප්‍රේල් 21 වන දින
උපහාර තිළිණ ප්‍රදානය කිරීමේ අවස්ථාව.



# කොළඹ ගංගාරාම විහාරස්ථානයේ 2023 ජනවාරි 1 වන දින වසරේ පළමු හීල් දානමය පිංකම

**සෑම වර්ෂයකම සිදු කරන වසරේ ප්‍රථම හීල් දානමය පිංකම මෙත්සවිය කාන්තා කමිටුවේ සංවිධාන ශක්තියෙන් සහ සාමාජිකයින්ගේ ආධාර උපකාරයෙන් හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේදී සිදු කරන ලදී**




















**කොළඹ 07, බෞද්ධාලෝක මාවතේ පිහිටි ජයන්ති ළමා නිවාසයේ දරුවන් සඳහා දහවල් දානය හා අත්‍යාවශ්‍ය භාණ්ඩ පරිත්‍යාග කිරීම 2024 ජනවාරි 01 දින සිදු කරන ලදී.**






දිනකර මුද්‍රණාලය

2/99, නාවල පාර, නුගේගොඩ 011 2827044 / 0712 285 680 072 353 4915
dinakara.priyantha@gmail.com